සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය

**නම/විභාග අංකය :-- ................................................................................. කාලය : පැය 02 යි.**

**I ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
**I වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1. ස ග රි ස, රි ම ග රි, ................. රටාවේ හිස්තැනට සුදුසු ස්වර පාදය වන්නේ,
   1. ග ම ප ග 2. ග ප ම ග 3. ග ප ග ම 4. ග ම ග ප

2. 'රි, ගු, ම', ධු, නි' ස්වර හඳුන්වනු ලබන්නේ,
   1. ප්‍රකෘති ස්වර වශයෙන් 2. විකෘති ස්වර වශයෙන්
   3. කෝමල ස්වර වශයෙන් 4. ශුද්ධ ස්වර වශයෙන්

3. මාත්‍රා හතර බැගින් බෙදෙන ගී පාදය තෝරන්න.
   1. සුවඳ පද්ම ඕලු ආදී..... 2. සසර වසන තුරු......
   3. මොනවද මුත්තේ මොකද කරන්නේ... 4. නිල් අහස් තලේ.....

4. ලයෙහි ප්‍රභේද,
   1. දෙකකි 2. තුනකි. 3. හතරකි. 4. පහකි.

5. අවග්‍රහයෙන් ගැයෙන ගී පාදයකි.
   1. හෙළ / ජාඍතික / අභිමාඍ /නේඍඍඍ /ඍඍවැඩු 3. ගලන / ගඟකි / ජීඍවී / තේඍඍ
   3. + සස ර/ වසන / තුරුඍ / ඍඍඍ 4. පෙරදිග/ මුතුඇට/ යයිමේඍ /ඍඍඍඍ

6. ''මං වගේ පේඩි කතක් මනා.....'' යන ගීතය
   1. රබන් ගීයකි. 2. කෝලම් ගීයකි.
   3. නූර්ති ගීයකි. 4. උපදේශාත්මක ගීයකි.

7. සරල ස්වර පුවරු වාදනයේදී 'ස,රි,ග,ම' යන ස්වර සඳහා පිළිවෙලින් 1, 2, 3, 4 යන ඇඟිලි භාවිත කළේ නම් 4, 3, 4, 2, 1, 2, 1 වශයෙන් ඇඟිලි භාවිත කරමින් වාදනය කළ විට වාදනය වන ස්වර වන්නේ,
   1. ම,ග,ම,ස,රි,ස,රි 2. ම,ග,ම,රි,ස,රි,ස
   3. ස,රි,ම,ග,රි,ස,රි 4. ග,ම,ග,රිස,රි,ස

8. ''දන්න වංහුං අප කන්නසාමි'' හා ''අඹ දඹ නාරං කෙසෙල් දෙල්'' යන ගීත අයත් ගී වර්ගය වනුයේ,
   1. සරල ගීත 2. ස්වර ස්ථාපන ගීත
   3. උපදේශාත්මක ගීත 4. නූර්ති ගීත

9. ''අතට වෙරළු ඇහිඳ ගෙනේ...'' කවි පාදය ගායනයේදී මාත්‍රා බෙදනුයේ,

1. 1 2 3 4 | 1 2 3 4 වශයෙනි.
2. 1 2 3 | 1 2 3 වශයෙනි.
3. 1 2 | 1 2 3 වශයෙනි.
4. 1 2 3 | 1 2 3 4 වශයෙනි.

10. ස ස ග | රි රි ම | ග ග ප | ම ධ ප යන ස්වර පාදය හා ගැළපෙන ස්වර ස්ථාපන ගී පාදය තෝරන්න.

1. ඈත ඈදී යළි මෑතට පාවේ.
2. පුංචි තාරකා පුංචි තාරකා
3. බැතිනා සිරිපා කරුණා කරනා
4. ඈත හිමේ ගිරි මුදුණේ සිසිල මැවෙනවා

**I වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**
**(පොත පත කියවා, අඹ දඹ නාරං......, සමන් වැලේ මල්, අම්මා සඳකි...., කඳු කඳු නැගෙනා...)**

11. ................................................................ ගීතය අයත් නාට්‍ය ශෛලියේ හින්දුස්ථානී සංගීතමය ලක්ෂණ ප්‍රධාන වේ.

12. ................................................................ සමාජයට උපදේශයක් ලබා දෙන ගීතයකි.

13. ................................................................ ගීතය ගු, නි ස්වර යෙදෙන ස්වර ස්ථාපන ගීතයකි.

14. ................................................................ ගීතය ශුද්ධ ස්වර පමණක් යෙදෙන ස්වර ස්ථාපන ගීතයකි.

15. ................................................................ ගීතය අවග්‍රහයෙන් ගැයේ.

**I ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා, පහත සඳහන් කියමන් නිවැරදි නම් ( √ ) ලකුණ ද, වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.**

16. දෝමි / කිත / කිත / දෝමි සුළු තනි තිතට අයත් උඩරට බෙර පදයකි. ( )

17. සමග්‍රහය යනු තාලය ඇරඹීමෙන් පසු ගීතය ගායනය කිරීමයි. ( )

18 තනි තිතෙහි ප්‍රභේද දෙකකි. ( )

19. සප්තකයක් තුළ ඇති කෝමල ස්වර ගණන හතරකි. ( )

20. කෝලම් රංග සම්ප්‍රදායේ රංග භූමිය තානායම්පොළ ලෙස හඳුන්වනු ලබයි. ( )

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

**I පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

**I දී ඇති සංගීත භාණ්ඩ උපයෝගී කර ගනිමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1.

A 

B 

C 

D 

E 

F 

I. ඉහත A,B,C,D,E, F රූප සටහන්වලට අදාළ සංගීත භාණ්ඩය නම් කරන්න. (ලකුණු 12)

II. ඉහත සංගීත භාණ්ඩ අතුරින් තත් සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III. ඉහත භාණ්ඩ අතුරින් පෙරදිග සුෂිර සංගීත භාණ්ඩ නම් කරන්න. (ලකුණු 04)

2. I. පහත ලැයිස්තුවේ සඳහන් වන්නේ සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ යන ත්‍රිවිධ ග්‍රහයින්ගේ යෙදෙන ගීත කිහිපයකි. එම ගීත අදාල ග්‍රහයට ගැලපෙන පරිදි පහත වගුවෙහි පෙළ ගස්වන්න.

1. දුර පෙනෙන තැනිතලා
2. සසර වසන තුරු
3. ගලන ගඟකි ජීවිතේ
4. සාදු දන්තදා....
5. මට මැණි වගේ.....
6. පෙරදිග මුතු අටයයි මේ.
7. හෙළ ජාතික අභිමානේ
8. අම්මා සඳකි.
9. ලංකා ලංකා
10. පාන්කිරිත්තා

| සමග්‍රහ | අවග්‍රහ | විෂමග්‍රහ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ලකුණු 2 x 10 = 20)

3. I. වෙස් මුහුණු පැළඳ රඟ දක්වන ඔබ උගත් ජන නාටකයක් නම් කරන්න. (ලකුණු 02)

II. එම ජන නාටකය පහත සඳහන් කරුණු යටතේ විමසන්න

(a) පවතින ප්‍රදේශය

(b) යොදා ගන්නා සංගීත භාණ්ඩ

(c) එම නාටකයේ විශේෂ ලක්ෂණ (ලකුණු 4 x 3 = 12)

III. ලොංචිනාගේ චරිත ලක්ෂණ 3 ක් ලියා දක්වන්න. (ලකුණු 06)

4. A. 'උඩු නියරින් වැටී ගෙනේ

මිටි නියරින් වැටී ගෙනේ''

I. ඉහත කවියෙහි ඉතිරි ගී පාද දෙක ලියා දක්වන්න. (ලකුණු 04)

II. ඉහත දක්වා ඇති කවි පාද කුමන ගායන හා බැඳී පවතින්නක් ද? (ලකුණු 04)

III. ඉහත ජනගීතය ගැයෙන තිත නම්කර බෙරපදය ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

IV. ඔබ ප්‍රස්තාර කළ බෙර පදයට ගැළපෙන තවත් ගීත පාදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

හෝ

B. I නූර්ති රංග සම්ප්‍රදායේ සුවිශේෂී ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ලකුණු 08)

II. ඔබ දන්නා නූර්ති ගීතයක මුල් කොටස ලියා දක්වන්න (ලකුණු 08)

III. නූර්ති ගීත සඳහා වාදනය කළ සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I කොටස

1. 2    2. 2    3. 3    4. 2    5. 3    6. 2

7. 2    8. 4    9. 1    10. 3    11. අඹ දඹ නාරං......

12. සමන් වැලේ මල්    13. පොත පත කියවා    14. කඳු කඳු නැගෙනා    15. අම්මා සඳකි

16. √    17. x    18. x    19. √    20. √

(ලකුණු 2 බැගින් 2 x 20 = 40)

### II කොටස

01. i. A වයලීනය    B ගිටාරය    C සිතාරය    D බටනලාව    E සර්පිනාව    F තබ්ලාව

(ලකුණු 2 බැගින් ලකුණු 12)

ii. වයලීනය, ගිටාරය සිතාරය A, B, C (ලකුණු 04)

iii. බටනලාව, සර්පිනාව හෝ D, E (ලකුණු 04)

i

02

| සමග්‍රහ | අවග්‍රහ | විෂමග්‍රහ |
|---|---|---|
| 3. ගලන ගඟකි<br>6. පෙරදිග මුදු<br>9. ලංකා ලංකා<br>10. පාන්කිරිත්තා | 2. සසර වසන<br>4. සාධු දන්තදා<br>8. අම්මා සඳකි | 1. දුර පෙනෙන<br>5. මට මැණි වගේ<br>7. හෙළ ජාතික |

ගීත සමග්‍රහ අවග්‍රහ හෝ විෂමග්‍රහ යන කොටස් යටතේ වර්ග කිරීම. (ලකුණු 2 x 10 = 20)

03. i. කෝලම් නාට්‍ය (ලකුණු 02)

ii. (a) බෙන්තර, බලපිටිය, අම්බලන්ගොඩ, මිරිස්ස ආදී වශයෙන්

(b) පහතරට බෙරය, හොරණෑව

(c) වෙස් මුහුණු පැළඳීම (ලකුණු 4 x 3 = 12)

iii. ලොංචිනා චරිතයට අදාළ ඕනෑම චරිත ලක්ෂණ තුනක් ලියා ඇත්නම්

කපටි චරිතයකි.    මායම් චරිතයකි    සමාජයේ අනුකම්පාව දිනා ගැනීමට උනන්දුවන චරිතයකි.

(ලකුණු 06)

04. i. කලව්ටි බොල් පොළා ගෙනේ , එයි අම්මා විගසකිනේ (ලකුණු 04)

A ii. දරු නැලවිලි ගී

iii. මහ තිත (ලකුණු 04)

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|
| දො | දො | ං | ත | ත | කු | දො | ං |

(ලකුණු 06)

iv. බෙර පාදයට ගැළපෙන ගී පාදයට (ලකුණු 06)

B i. හින්දුස්ථානී සංගීත සම්ප්‍රදායේ අභාසය ලැබීම

ප්‍රධාන වාද්‍ය භාණ්ඩ සර්පිනාව හා තබ්ලාව    වේදිකාවේ රංගනයේ යෙදීම

ගැහැණු පිරිමි දෙපක්ෂයම රංගනයේ යෙදීම    දොහොරාව භාවිතය ආදී වශයෙන් (ලකුණු 08)

ii. නූර්ති ගීතයක මුල් කොටස ලියා දක්වීම (ලකුණු 08)

iii. භාණ්ඩ නම් කිරීමට (ලකුණු 04)